# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2022 ජූලි මස 15 වන දින

## **II** වන කොටස

## අතිරේකය

**(2022.07.18 දින නිකුත් කරන ලදී)**


# ළමයින් සහ තරුණ තැනැත්තන් (සංශෝධන)

**(23 වන අධිකාරය වූ) ළමයින් සහ තරුණ තැනැත්තන් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 30.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

*2 වන වගන්තිය* : මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (23 වන අධිකාරය වූ) ළමයින් සහ තරුණ තැනැත්තන් ආඥාපනත සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ-

(අ) ප්‍රධාන ප්‍රඥප්තියේ කාර්යය සඳහා ළමයකු විය යුතු තැනැත්තකුගේ වයස අවුරුදු දහසයේ සිට අවුරුදු දහඅට දක්වා ඉහළ නැංවීම;

(ආ) ප්‍රධාන ප්‍රඥප්තියේ සහ ප්‍රධාන ප්‍රඥප්තිය සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියක "තරුණ අය" යන වචන සඳහන්වන සෑම ස්ථානයකින් ම ඒ සඳහන ඉවත් කිරීම; සහ

(ඇ) ප්‍රධාන ප්‍රඥප්තිය, "ළමා ආඥාපනත" යනුවෙන් නැවත නම් කිරීම වේ.

*3 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ එහි (4) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන, වයස අවුරුදු දාහතරට වැඩි ළමයකු සඳහා අදාළ කර ගැනීම පිණිස හැකියාව ලබා දීම වේ.

*4 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනවලට ආනුෂංගික වේ.

*5 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, මේ වගන්තියේ සඳහන් විධිවිධාන, වයස අවුරුදු දහසයට වැඩි ළමයකු සඳහා අදාළ කරවීම වේ.

*6 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ II වන කොටසේ උප ශීර්ෂය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන වගන්තිය මගින් සිදුකරනු ලබන සංශෝධනවලට ආනුෂංගික වේ.

*7 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර එහි නීතිය බලපෑම වනුයේ ළමුන්ට දඬුවම් කිරීම සම්බන්ධව සීමාවන් පැනවීම වේ.

*8 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2021 අංක 25 දරන දණ්ඩනීති සංග්‍රහය (සංශෝධන) පනතේ විධිවිධානවලට ආනුෂංගික වේ.

*9 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 7 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*10 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන සහ 13 වන වගන්ති මගින් කරන ලද සංශෝධනවලට ආනුෂංගික වේ.

*11 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන සහ 13 වන වගන්ති මගින් සිදුකරනු ලබන සංශෝධනවලට ආනුෂංගික වේ.

*12 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 13 වන වගන්තිය මගින් සිදුකරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*13 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර එහි නීතිය බලපෑම වනුයේ ළමුන්ට ශාරීරික දණ්ඩනය ලබාදීම ඉවත් කිරීම වේ.

*14 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 13 වන වගන්තිය මගින් සිදුකරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*15 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන වගන්තිය මගින් සිදුකරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*16 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන සහ 7 වන වගන්ති මගින් සිදුකරන ලද සංශෝධනවලට ආනුෂංගික වේ.

*17 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර එහි නීතිය බලපෑම වනුයේ අනුමත කළ පාසලක හෝ සහතික කළ පාසලක සිටිය යුතු කාලසීමාව, ඒ සම්බන්ධ අධිකරණ ආඥාවේ නිශ්චිතව දැක්වීම සඳහා විධිවිධාන හඳුන්වාදීම වේ.

*18 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන වගන්තිය මගින් සිදුකරන ලද සංශෝධනවලට ආනුෂංගික වේ.

*19 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, යම් අනුමත කළ පාසලක හෝ සහතික කළ පාසලක රඳවා තැබීමේ කාලසීමාව දීර්ඝ කිරීමේ දී ඉක්ම නොයා යුතු වූ වයස් සීමාව අවුරුදු දහනවයේ සිට අවුරුදු විසිඑක දක්වා වැඩි කිරීම වේ.

*20 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, යම් අනුමත කළ පාසලක හෝ සහතික කළ පාසලක රඳවා තැබීමේ කාලසීමාව අවසන් වීමෙන් පසුව කළමනාකරුවකු විසින් අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් අදාළවන ළමයකුගේ වයස් සීමාවන් සංශෝධනය කිරීම වේ.

*21 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 51අ අලුත් වගන්තියක් ඇතුළත් කරනු ලබන අතර එහි නීතිය බලපෑම වනුයේ සෑම අනුමත කළ පාසලක ම හෝ සහතික කළ පාසලක ම ප්‍රාථමික සහ ද්විතීයික අංශ තිබිය යුතු වන පරිදි විධිවිධාන හඳුන්වාදීම වේ.

*22 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනවලට ආනුෂංගික වේ.

*23 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනවලට ආනුෂංගික වේ.

*24 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 13 වන වගන්තිය මගින් සිදුකරන ලද සංශෝධනවලට ආනුෂංගික වේ.

*25 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ළමයකුගේ භාරකාරත්වය දරන, වගකීම දරන හෝ ළමයකුගේ රැකවරණය භාරව සිටින තැනැත්තකු, දණ්ඩ නීති සංග්‍රහයේ 345 වන, 360අ වන, 363 වන, 364 වන, 364අ වන, 365 වන හෝ 365ආ වන වගන්ති යටතේ වූ යම් වරදක් හෝ (30 වන අධිකාරය වූ) අසභ්‍ය ප්‍රකාශන ආඥාපනත යටතේ වූ යම් වරදක් ඒ ළමයා සම්බන්ධයෙන් සිදු කිරීමට සැලැස්වීම හෝ ඊට අනුබල දීම, ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ වරදක් වන බවට විධිවිධාන සැලැස්වීම වේ.

*26 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, වයස පිළිබඳ සීමා කිරීමකින් තොරව ළමයකු සඳහා මේ වගන්තිය අදාළවීම සඳහා හැකියාව ලබා දීම වේ.

*27 වන වගන්තිය* : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන වගන්තිය මගින් සිදුකරන ලද සංශෝධනවලට ආනුෂංගික වේ.

***28 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර එහි නීතිය බලපෑම වනුයේ 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතේ 31 වන වගන්තියේ විධිවිධාන හේතුවෙන් ඒ වගන්තිය තව දුරටත් අදාළ නොවීම වේ.

***29 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන වගන්තිය මගින් සිදුකරන ලද  සංශෝධනයට ආනුෂංගික වේ.

***30 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 88 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ "ළමයා" යනු වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තකු වශයෙන් නැවත අර්ථනිරූපණය කිරීම, 2 වන වගන්තිය මගින් සිදුකරන ලද සංශෝධනයට ආනුෂංගිකව "තරුණ තැනැත්තා" යන අර්ථනිරූපණය ඉවත් කිරීම සහ "තරුණ වරදකරුවන් සඳහා වූ පුහුණු පාසල" යන යෙදුම සඳහා වූ අලුත් අර්ථනිරූපණයක් හඳුන්වාදීම වේ.

ළමයින් සහ තරුණ තැනැත්තන්
(සංශෝධන)

එල්.ඩී.—ඕ. 26/2019

**(23 වන අධිකාරය වූ) ළමයින් සහ තරුණ තැනැත්තන් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

**1.** මේ පනත 2022 අංක    දරන ළමයින් සහ තරුණ තැනැත්තන් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය.

23 වන අධිකාරය සහ වෙනත් යම් ලිඛිත නීති ආදිය සංශෝධනය කිරීම

**2.** (1) (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (23 වන අධිකාරය වූ) ළමයින් සහ තරුණ තැනැත්තන් ආඥාපනතේ -

(අ) "ළමයින් සහ තරුණ තැනැත්තන් ආඥාපනත" යන වචන යෙදෙන කවර හෝ අවස්ථාවක දී, ඒ වචන වෙනුවට "ළමා ආඥාපනත" යන වචන ද;

(ආ) "ළමයින් සහ තරුණ තැනැත්තන්" යන වචන යෙදෙන කවර හෝ අවස්ථාවක දී, ඒ වචන වෙනුවට "ළමයින්" යන වචනය ද;

(ඇ) "ළමයා හෝ තරුණ තැනැත්තා" යන වචන යෙදෙන කවර හෝ අවස්ථාවක දී, ඒ වචන වෙනුවට "ළමයා" යන වචනය ද; සහ

(ඈ) "වයස අවුරුදු දහසය" යන වචන යෙදෙන කවර හෝ අවස්ථාවක දී, ඒ වචන වෙනුවට "වයස අවුරුදු දහඅට" යන වචන ද,

ප්‍රධාන ප්‍රඥප්තියට ආදේශ කරනු ලැබිය යුතු ය.

(2) වෙනත් යම් ලිඛිත නීතියක "ළමයින් සහ තරුණ තැනැත්තන් ආඥාපනත", "ළමයින් සහ තරුණ තැනැත්තන්" සහ "ළමයා හෝ තරුණ තැනැත්තා" යන වචන ප්‍රධාන ප්‍රඥප්තියට අදාළව යෙදී ඇති කවර හෝ අවස්ථාවක දී, ඒ වචන වෙනුවට, පිළිවෙළින්, "ළමා ආඥාපනත", "ළමයින්" සහ "ළමයා" යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය.

(3) ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ සාදන ලද යම් නියෝගයක හෝ රීතියක හෝ යම් දැන්වීමක, නිවේදනයක, ගිවිසුමක, සන්නිවේදනයක හෝ ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද වෙනත් ලේඛනයක "ළමයින් සහ තරුණ තැනැත්තන් ආඥාපනත", "ළමයින් සහ තරුණ තැනැත්තන්", "ළමයා හෝ තරුණ තැනැත්තා" සහ "වයස අවුරුදු දහසය" යනුවෙන් සඳහන් කර ඇති සෑම අවස්ථාවක දී ම, පිළිවෙළින් "ළමා ආඥාපනත", "ළමයින්", "ළමයා" සහ "වයස අවුරුදු දහඅට" යනුවෙන් කරන ලද සඳහන් කිරීමක් ලෙස කියවා තේරුම්ගත යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ-

(අ) "තරුණ තැනැත්තකු ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක දී" යන වචන වෙනුවට "වයස අවුරුදු දාහතරට වැඩි ළමයකු ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක දී" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) "තරුණ තැනැත්තා" යන වචන ඒ උපවගන්තියේ සඳහන් වන කවර හෝ අවස්ථාවකදී, ඒ වචන වෙනුවට "ඒ ළමයා" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ පැතිසටහනේ "ළමයින් සහ තරුණ වරදකරුවන්" යන වචන වෙනුවට "ළමයින්" යන වචනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ-

(අ) "නීත්‍යානුකූලව යථා කාලයේ දී" සහ "කළ යුතු ය:" යන වචන වෙනුවට පිළිවෙළින් "යථා කාලයේ දී" සහ "කළ යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) ඒ උපවගන්තියේ අතුරු විධානය ඉවත් කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "තරුණ තැනැත්තකු සම්බන්ධයෙන් වන අවස්ථාවක දී" සහ "ඒ තරුණ තැනැත්තා බන්ධනාගාරය වෙත භාර කරනු ලැබිය හැකි ය." යන වචන වෙනුවට පිළිවෙළින් "වයස අවුරුදු දහසයට වැඩි ළමයකු සම්බන්ධයෙන් වන අවස්ථාවක දී" සහ "වයස අවුරුදු දහසයට වැඩි එවැනි ළමයකු රැඳවුම් නිවාසයක රඳවා තබනු ලැබිය හැකි ය." යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ II වන කොටසේ උපශීර්ෂය සංශෝධනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ II වන කොටසේ 22 වන වගන්තියට පෙරාතුව ම සඳහන් වන උපශීර්ෂය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන උපශීර්ෂය ආදේශ කරනු ලැබේ:-

"ළමා වැරදිකරුවන්"

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය මෙයින් ඉවත්කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"ළමයින්ගේ දඬුවම් සම්බන්ධයෙන් වන සීමා කිරීම්

23. (1) ළමයකු යම් වරදක් සිදුකිරීම සඳහා බන්ධනාගාරගත කිරීමට ආඥාවක් කිරීම හෝ දඩයක් ගෙවීම පැහැර හැරීමේ දී, බන්ධනාගාරය වෙත භාර කිරීම නොකළ යුතු ය.

(2) වයස අවුරුදු දහසයට එළඹ ඇති හෝ ඊට වැඩි ළමයකු සම්බන්ධයෙන් වන විට, ඒ ළමයා නොහික්මුණු චරිතයකින් යුතු බවට සහ රැඳවුම් නිවාසයක හෝ සහතික කළ පාසලක රඳවා තැබිය නොහැකි බවට හෝ ඒ ළමයා එවැනි දූෂිත චරිතයක් ඇත්තකු වේ නම් එසේ රඳවා තැබීමට ඒ ළමයා සුදුසු තැනැත්තකු නොවන බවට පරිවාස නිලධරයාගේ මතය වන අවස්ථාවක දී, ඒ ළමයා සම්බන්ධයෙන් වෛද්‍ය විශේෂඥයන් විසින් සිදුකළ යුතු මනෝවිද්‍යාත්මක ඇගැයීමක් සිදු කර අධිකරණයට වාර්තා කරන ලෙස, අධිකරණය විසින්, පරිවාස නිලධරයාට විධානයක් කරනු ලැබිය යුතු ය.

(3) ඒ ළමයා රැඳවුම් නිවාසයක රඳවා තැබීමට සුදුසු නොවන බවට (2) වන උපවගන්තියේ සඳහන් කළ මනෝවිද්‍යාත්මක ඇගැයීම මගින් තහවුරු කරනු ලබන අවස්ථාවක දී, (25 වන අධිකාරය වූ) තරුණ වරදකරුවන් (පුහුණු පාසල්) ආඥාපනතේ නිශ්චිතව දක්වා ඇති වයස සහ රඳවා තැබීමේ කාල සීමාව සම්බන්ධයෙන් වූ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ඒ ළමයාව තරුණ වරදකරුවන් සඳහා වූ පුහුණු පාසලක රඳවා තැබීමට අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

“(1) යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන අවස්ථාවේ දී, ඒ තැනැත්තාට වයස අවුරුදු දහඅටට අඩු නම් ඒ තැනැත්තා සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 53 වන වගන්තිය යටතේ යම් අධිකරණයක් මගින් මරණීය දණ්ඩනය වෙනුවට, රඳවා තැබීමේ දණ්ඩනයක් ලබා දී ඇති අවස්ථාවක දී, අධිකරණය විසින්, ඒ තැනැත්තා, ඒ දණ්ඩනයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි කාලසීමාවක් සඳහා රැඳවුම් නිවාසයක රඳවා තැබීමට ආඥාවක් කරනු ලැබිය හැකි ය.”; සහ

(2) එහි (3) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

“(3) (1) වන උපවගන්තියේ දක්වා ඇති පරිදි දණ්ඩ නීති සංග්‍රහයේ 53 වන වගන්තිය යටතේ අධිකරණයක් විසින් කරන ලද ආඥාවකට හෝ (2) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයකු විසින් කරන ලද විධානයකට අනුව රඳවා තබන ලද තැනැත්තකු, එසේ රඳවා තබනු ලබන කාලය තුළ, නෛතික භාරකාරත්වය යටතේ සිටින බවට සලකනු ලැබිය යුතු ය.”.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "ඒ අධිකරණය විසින්," යන වචන වල සිට "රඳවා තැබීමට නියම කරනු ලැබිය යුතු ය." යන වචන දක්වා වූ සියලු වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන්:-

"ඒ අධිකරණය විසින්, ඒ ආඥාවේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි කාලයක් සඳහා ඒ ළමයාව රැඳවුම් නිවාසයක් භාරයේ තැබීමට ආඥාවක් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, වයස අවුරුදු දහසයට එළඹ ඇති හෝ ඊට වැඩි ළමයකු සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, 23 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ ළමයා සම්බන්ධයෙන් අදාළ කර ගනු ලැබිය යුතු ය."; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "28(1) වන වගන්තිය හෝ 29(1) වන වගන්තිය යටතේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "28(1) වන වගන්තිය යටතේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "වයස අවුරුදු දොළහට එළඹ ඇති ළමයකු හෝ තරුණ තැනැත්තකු" යන වචන වෙනුවට "වයස අවුරුදු දොළහට එළඹ ඇති ළමයකු" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "28 (1) වන වගන්තිය හෝ 29(1) වන වගන්තිය යටතේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "28(1) වන වගන්තිය යටතේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ පැති සටහනේ "ළමා හෝ තරුණ වරදකරුවකු" යන වචන වෙනුවට "ළමා වරදකරුවකු" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ 28 (1) වන වගන්තිය හෝ 29 (1) වන වගන්තිය යටතේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "28 (1) වන වගන්තිය යටතේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ පැති සටහනේ "ළමා හෝ තරුණ වරදකරුවකු" යන වචන වෙනුවට "ළමා වරදකරුවකු" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය ඉවත් කිරීම

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියේ "25 සිට 29 දක්වා වූ වගන්ති" යන වචන සහ ඉලක්කම් වෙනුවට "25 සිට 28 දක්වා වූ වගන්ති" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියේ පැති සටහනේ "ළමා හෝ තරුණ වරදකරුවකු" යන වචන වෙනුවට, "ළමා වරදකරුවකු" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ආ) තරුණ වරදකරුවන් සඳහා වූ පුහුණු පාසලක රඳවා තබා ගැනීම සඳහා ආඥාවක් කරනු ලැබ ඇති සහ පාසලක පුහුණුව ලැබීමට එකඟ වීමේ කොන්දේසිය මත ජනාධිපතිවරයා විසින් සමාව දෙනු ලැබ ඇති වයස අවුරුදු දහසයට එළඹ ඇති හෝ ඊට වැඩි ළමයකු;";

(2) ඒ වගන්තියේ අතුරු විධානයේ -

(අ) ඒ අතුරු විධානයේ (අ) ඡේදයේ "තැනැත්තකු" යන වචනය වෙනුවට "ළමයකු" යන වචනය ආදේශ කිරීමෙන්;

(ආ) ඒ අතුරු විධානයේ (ආ) ඡේදයේ "තරුණ තැනැත්තකු" යන වචන වෙනුවට "ළමයකු" යන වචනය ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ පැති සටහනේ "ළමයින් සහ තරුණ වරදකරුවන්" යන වචන වෙනුවට "ළමා වරදකරුවන්" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය සංශෝධනය කිරීම

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"අනුමත කළ පාසල් හෝ සහතික කළ පාසල් ආඥාවල කාලසීමාව

42. ළමයකු, අනුමත කළ පාසලක් හෝ සහතික කළ පාසලක් වෙත යැවීම සඳහා අධිකරණය විසින් ආඥාවක් කරනු ලබන අවස්ථාවක දී අවුරුදු තුනකට නොවැඩි විය යුතු රඳවා තබා ගැනීමේ කාලසීමාවක් ඒ ආඥාවේ නිශ්චිතව සඳහන් විය යුතු අතර එය, අවස්ථාවෝචිත පරිදි, ඒ ළමයා ඒ අනුමත කළ පාසලේ හෝ සහතික කළ පාසලේ එකී ආඥාවේ නිශ්චිතව සඳහන් කාලසීමාව අවසන් වන තෙක් රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් වන බලය දීමක් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කිරීම

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියේ පැති සටහනේ "ළමයින් හෝ තරුණ තැනැත්තන්" යන වචන වෙනුවට "ළමයින්" යන වචනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය සංශෝධනය කිරීම

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තියේ "වයස අවුරුදු දහනවය" යන වචන වෙනුවට "වයස අවුරුදු විසි එක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය සංශෝධනය කිරීම

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "වයස අවුරුදු දහහතරට එළඹ නොමැති නම් ඔහු වයස අවුරුදු දහසයට එළඹෙන තෙක්" යන වචන වෙනුවට "වයස අවරුදු දහඅටට එළඹ නොමැති නම් ඔහු වයස අවුරුදු විස්සට එළඹෙන තෙක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 51අ වන වගන්තිය ඇතුළත් කිරීම

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 51අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

"සෑම අනුමත කළ හෝ සහතික කළ පාසලක ම ප්‍රාථමික සහ ද්විතීයික අංශ තිබිය යුතු බව

51අ. (1) සෑම අනුමත කළ පාසලක ම හෝ සහතික කළ පාසලක ම-

(අ) වයස අවුරුදු පහළොවට එළඹ නොමැති ළමයින් රඳවා තැබිය යුතු "ප්‍රාථමික අංශයක්"; සහ

(ආ) වයස අවුරුදු පහළොවට එළඹ ඇති එහෙත් වයස අවුරුදු දහඅටට එළඹ නොමැති ළමයින් රඳවා තැබිය යුතු "ද්විතීයික අංශයක්",

තිබිය යුතු ය.

(2) ළමයකු අනුමත කළ පාසලක් වෙත හෝ සහතික කළ පාසලක් වෙත භාර කරමින් -

(අ) මහෙස්ත්‍රාත්වරයකු විසින් 26 වන වගන්තිය යටතේ ආඥාවක් කරනු ලබන අවස්ථාවක දී; හෝ

(ආ) අමාත්‍යවරයා විසින් 32 වන වගන්තිය යටතේ නියමයක් කරනු ලබන අවස්ථාවක දී,

ළමයාගේ වයස අනුව ඒ ළමයා භාරදිය යුත්තේ ප්‍රාථමික අංශයට ද නැතහොත් ද්විතීයික අංශයට ද යන්න එසේ භාර දෙනු ලබන අවස්ථාවේ දී ඒ 26 වන වගන්තිය යටතේ වූ ආඥාවේ හෝ 32 වන වගන්තිය යටතේ වූ නියමයේ නිශ්චිතව සඳහන් කළ යුතු ය:

එසේ වුව ද, ඒ පාසලේ කළමනාකරු විසින්, ප්‍රාථමික අංශයේ සිටින ළමයකු, ඒ ළමයා වයස අවුරුදු පහළොවට එළඹීමේ දී, ද්විතීයික අංශය වෙත මාරු කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය සංශෝධනය කිරීම

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ "(අ) ඔහු වයස අවුරුදු දහසයට අඩු" යන වචන වෙනුවට "(i) ඔහු වයස අවුරුදු දහසයට අඩු" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "(ආ) ඔහු වයස අවුරුදු දහසයට එළඹ", යන වචන වෙනුවට" (ii) ඔහු වයස අවුරුදු දහසයට එළඹ" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය සංශෝධනය කිරීම

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තියේ ""ළමයා" සහ "තරුණ තැනැත්තා" යන යෙදුම්වලින්" යන වචන වෙනුවට ""ළමයා" යන යෙදුමෙන්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය සංශෝධනය කිරීම

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තියේ (6) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය සංශෝධනය කිරීම

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "ස්ත්‍රියක වන්නා වූ තරුණ තැනැත්තකුගේ" යන වචනවල සිට "එසේ කිරීමට අනුබල දෙන්නේ නම්" යන වචන දක්වා වූ සියලු වචන වෙනුවට "ළමයකුගේ භාරකාරත්වය දරන, වගකීම දරන හෝ ළමයකුගේ රැකවරණය භාරව සිටින යම් තැනැත්තකු,

දණ්ඩ නීති සංග්‍රහයේ 345 වන, 360අ වන, 363 වන, 364 වන, 364අ වන, 365 වන හෝ 365ආ වන වගන්ති යටතේ වූ යම් වරදක් හෝ (30 වන අධිකාරය වූ) අසභ්‍ය ප්‍රකාශන ආඥාපනත යටතේ වූ යම් වරදක්, ඒ ළමයා සම්බන්ධයෙන් සිදු කිරීමට සලස්වන්නේ නම් හෝ එසේ කිරීමට අනුබල දෙන්නේ නම්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "ස්ත්‍රියක වන්නා වූ ළමයකු හෝ තරුණ තැනැත්තකු සම්බන්ධයෙන් (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද යම් වරදක් සිදුකර ඇති අවස්ථාවක දී, යම් තැනැත්තකු විසින්, ඇයට, ඔහු දැනුවත්ව, යම් ගණිකා වෘත්තියේ යෙදෙන්නකු සමඟ හෝ දුරාචාරී චරිතයක් සහිත බවට දන්නා තැනැත්තකු සමඟ ආශ්‍රය කිරීමට ඉඩ සලසා ඇත්නම්" යන වචන වෙනුවට "ළමයකු සම්බන්ධයෙන් (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද යම් වරදක් සිදුකර ඇති අවස්ථාවක දී, යම් තැනැත්තකු විසින්, ඒ ළමයාට, ඔහු දැනුවත්ව යම් ගණිකා වෘත්තියේ යෙදෙන්නකු සමඟ හෝ දුරාචාරී චරිතයක් සහිත බවට දන්නා තැනැත්තකු සමඟ ආශ්‍රය කිරීමට ඉඩ සලසා ඇත්නම්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ පැති සටහනේ "වයස අවුරුදු දහසයට අඩු ගැහැණු ළමයකු" යන වචන වෙනුවට "ළමයකු"' යන වචනය ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය සංශෝධනය කිරීම

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "අවුරුදු හතරට එළඹ සිටින ළමයකුගේ භාරකාරත්වය දරන" යන වචනවල සිට "වාසය කිරීමට" යන වචන වෙනුවට "ළමයකුගේ භාරකාරත්වය දරන, වගකීම දරන හෝ රැකවරණය භාරව සිටින යම් තැනැත්තකු, ඒ ළමයාට ගණිකා නිවාසයක හෝ ඒ ආසන්නයේ වාසය කිරීමට" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:-

"ගණිකා නිවාසවල
සිටීමට ළමයින්ට ඉඩ
හැරීම.".

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තියේ පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය සංශෝධනය කිරීම

"ළමයින්ව සිඟමනේ
යෙදවීම හෝ
ළමයින්ට සිඟමනේ
යෙදීමට ඉඩ
සැලසීම.".

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය ඉවත් කිරීම

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තිය සංශෝධනය කිරීම

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 88 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 88 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) "ළමයා" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

""ළමයා" යන්නෙන්, වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තකු අදහස් වේ;";

(2) "උපලේඛනගත වරද" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

""තරුණ වරදකරුවන් සඳහා වූ පුහුණු පාසල" යන්නෙන් (25 වන අධිකාරය වූ) තරුණ වරදකරුවන් (පුහුණු පාසල්) ආඥාපනත යටතේ පිහිටුවන ලද පුහුණු පාසලක් අදහස් වේ;"; සහ

(3) "තරුණ තැනැත්තා" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**31.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.